42

# ශ්‍රී ලංකාවේ නූර්ති සංගීතය විෂයෙහි හින්දුස්තානි සංගීතයේ බලපෑම

*අයි. ඒ. සමන්ති සන්ධ්‍යා කුමාරි* [1]
HU/2012/0378

ශ්‍රී ලංකාවේ නූර්ති නාටකවල උපයුක්ත වූ සංගීතය විෂයෙහි උත්තර භාරතීය සංගීතයේ බලපෑම කෙබඳු ද යන්න පිළිබඳ මෙම පර්යේෂණයෙන් අධ්‍යයනයට ලක් කෙරේ. සාහිත්‍යයික මූලාශ්‍ර හා අදාළ විෂය සම්බන්ධ පර්යේෂකයින් විසින් සිදු කර ඇති පර්යේෂණ ග්‍රන්ථ මෙන්ම ශ්‍රව්‍ය - දෘශ්‍ය මූලාශ්‍ර ද මෙම පර්යේෂණයේ ක්‍රමවේදය සඳහා භාවිත කරනු ලැබේ. නූර්ති සංගීතය විෂයෙහි හින්දුස්තානි සංගීතයේ භාවිත සරල රාග සහ තාල මෙන්ම සංගීත භාණ්ඩ ද උපයෝගී කොට ඇත. නූර්ති ගීත ආකෘතිය ද උත්තර භාරතීය ඛ්‍යාල් ගායන ආකෘතියට සමාන ස්වරූපයක් ගෙන ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රචලිත නූර්ති නාටක කිහිපයක් ඇසුරින් යථෝක්ත කාරණාව සාධනය කිරීමට මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කෙරේ.

මුඛ්‍ය පදඃ නූර්ති නාටක, නූර්ති සංගීතය, උත්තර භාරතීය සංගීතය, රාග, තාල, ගීත ආකෘතිය

---

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) දෙවන වසර*